www.agaram.lk

NALANDA VIDYALAYA NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 9 ශ්‍රේණිය | සිංහල | ඒකකය : 15 |
|---|---|---|

**සිරම්බි අඩිය - සාරාංශකරණය**

I කොටස

**පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1) "සිලෝන් කැෆ්ර්වරු" මෙරටට පැමිණීමට පාදක වූ හේතුව කුමක්ද?

.............................................................................................................................

2) ඉංග්‍රීසි පාලන සමයේ "කැෆ්ර්වරු" අනුයුක්ත කරනු ලැබූ වෘත්තීන් 2ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

3) තැපැල් සේවය ආශ්‍රිතව ඔවුන් ඉටුකළ කාර්යයන් 2ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

4) "කැෆ්ර්වරුන්ට" ආවේණික වූ විශේෂිත ගීත වර්ගය කුමක්ද? ..........................................................

5) "කැෆ්ර්වරුන්ගේ" විවාහ උත්සවයක දක්නට ලැබෙන විශේෂ අවස්ථා 2ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

(2 x 5 = 10)

6) සිරිපා වන්දනාවේ යන බැතිමතුන් ව්‍යාවහාර කරන පහත වචන සඳහා සාමාන්‍ය ව්‍යවහාරයන් ලියන්න.

I) ඉර සේවය - ..........................................................

II) කිරි කෝඩු - ..........................................................

III) නඩය - ..........................................................

IV) කෝඩුකාරයා - ..........................................................

V) සිරිපා කරුණා කරනවා - ..........................................................

VI) නඩේ ගුරා - ..........................................................

VII) දඬු කෝඩු - ..........................................................

VIII) සැහැල්ලුව - ..........................................................

IX) නඩය - ..........................................................

X) දෙයියන්ගෙ රට - ..........................................................



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

7) පහත දැක්වෙන වැදි ජන වහරේ එන යෙදුම් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයන් වරහන් තුළින් තෝරා ලියන්න.

I. හඳයා - ........................................................
II. මල් නැති - ........................................................
III. කංකුණා - ........................................................
IV. බොට කඳා - ........................................................
V. කැකුලී - ........................................................
VI. ගැට මන්දා - ........................................................
VII. මලාලීය - ........................................................
VIII. මාහූරා - ........................................................
IX. රුකුල් වෙනවා - ........................................................
X. වප්පිලැත්තො - ........................................................

( ගෝනා, රෑ වෙනවා, දුන්න, කුරුල්ලා, නෑනා, හොල්මන, අලියා, ගෑණු ළමයා, කිඹුලා, ප්‍රධානියා)

(ලකුණු 20)

## II කොටස

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

8) I) 'සාරාංශකරණය' යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න.

........................................................................................................................
........................................................................................................................

II) 'සාරාංශකරණය' ඉතා වැදගත් වන්නේ ඇයි කරුණු 2ක් ලියන්න.

........................................................................................................................
........................................................................................................................

III) පාඨයක් සාරාංශ කිරීමේ දී අවධානයට ලක් කළ යුතු වැදගත් කරුණු මොනවාද?

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(ලකුණු 10)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

9) පහත දී ඇති පාඨ දී ඇති වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වනසේ සාරාංශ කරන්න.

I. සිංහලය සතුව හෝ පාලිය හෝ වැනි පොදු වහරින් ගිලිහීමෙන් ජීවයෙන් තොර වූ බසක් නොවේ. ජීවය සහිත බස අනවරතයෙන් වෙනස් වෙයි. වෙනස් වන්නේ ජන වහර අනුවයි. ජන වහර සමාජ සිරිත් විරිත් හා ජීවිතය අනුව වෙනස් වෙයි. සකුව හා එහි වහර මෙන් ව්‍යාවහාර භාෂාවක් වන සිංහලය පොදු ජනයාගෙන් වෙන් කොට වෙනස් නොවන වියරණ වැටකින් ආරක්ෂා කළ නොහැකි ය. ජන සාහිත්‍යයෙන් ඉඳුරා වෙන්කොට තැබිය හැක්කක් නොවේ. පණ්ඩික ප්‍රිය සිංහල සාහිත්‍ය.

(වචන 68)

II. නිරිත දිග මෝසම් සුළං වාරය අවසාන වී ඊසාන දිග මෝසම් ආරම්භ වනවාත් සමඟ ම දස දහස් ගණනින් අමුතු අමුතු මාදිලියේ සංචාරක පිරිසක් ලෝකයේ නා නා දිග්භාගවලින් ශ්‍රී ලංකාවට ඇදී එති. අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් යන මාස වලදී ශ්‍රී ලංකාවට පැමිණෙන මෙම සංචාරක අමුත්තෝ සය මසක නිවාඩුවක් මේ පාරාදීසයෙහි ගත කොට යළිත් අප්‍රේල් හා මැයි මාසවල දී ස්වකීය ගම් බලා ආපසු නික්ම යති. මේ සංචාරක අමුත්තෝ වූ කලී අන් කිසිවෙකුත් නොව සිය රටවල පවතින ශීත ඍතුවෙන් බේරීම සඳහා මේ රම්‍ය දිවයිනට වර්ෂයක් පාසා පැමිණෙන සංචාරක පක්ෂීහු ය.

(වචන 90)

III. ශිෂ්‍ය උපදේශනය හා තොරතුරු සැපයීම සඳහා මනාව සංවිධානය වූ පාසල් පුස්තකාලයකින් ලබා ගත හිකි සේවය ඉතා පුළුල් ය. පාසල් සිසුන්ට පමණක් නොව ගුරු මණ්ඩලයට හා ආදි ශිෂ්‍යයන්ට ද පාසල් කාලය තුළත් ඉන් බාහිරව ද තොරතුරු ලබා දීම පුස්තකාලයේ වගකිමක් වේ. වෘත්තීය, උපදේශනය, රැකියා අවස්ථා සහ තීරණ ගැනීම උදෙසා අවශ්‍ය වන දත්ත ලබා දීම, පුස්තකාලයේ කාර්යය වේ. දරුවන්ට විෂයානුබද්ධ ක්‍රියා පිළිබඳ තොරතුරු ලබා ගැනිමට ද විෂයන් පිළිබඳ අමතර දැනුම ලබා ගැනීමට ද පුස්තකාලය උදව් වේ. රට වටා ඇති තොරතුරු පුස්තකාලයෙන් ලබා ගත හැකි ය. අධ්‍යාපනයට සම්බන්ධ රචනා කර ඇති ග්‍රන්ථ මගින් හා විශේෂඥයින් හා පර්යේෂකයින් විසින් සැකසුණු ග්‍රන්ථවලින් ද පුළුල් දැනුමක් පුස්තකාල මගින් ලබා ගත හැකි ය.

(වචන 96)

IV. දහසය වැනි සියවසේ සිට ලක්දිව පහත රට ප්‍රදේශවල පාලනය පෘතුගීසි හා ලන්දේසි ජාතිකයින් අතට පත් වීම නිසා පැරණි වැඩවසම් පාලන රටාව ක්‍රමයෙන් දිය වන්නට විය. මහනුවර සමයේ කුලවල උස් පහත්කම් අනුව නීතිය ක්‍රියාත්මක වූ නමුත් ඒ තත්ත්වය රෝමානු ලන්දේසි නීතිය ක්‍රියාත්මක වීමෙන් පසු අහෝසි වී ගියේය. නීතිය හමුවේ සියලු දෙනා ම එක හා සමාන ලෙස පිළිගැනිණි. උපතින් ලැබුණු කුල ප්‍රසාදය නැතිවී ගියේ ය. ඉංග්‍රීසි පාලන යුගයේ දී ශ්‍රී ලංකාවේ සමාජ ක්‍රමයෙහි බලවත් විපර්යාස ඇති වන්නට විය. වෙළඳ බෝග වගාව ව්‍යාප්ත වීම, රාජකාරී ක්‍රමය අහෝසි කිරීම, භාණ්ඩ හුවමාරුව වෙනුවට මුදල් භාවිතය ක්‍රියාත්මක වීම, අලුත් රැකිරක්ෂා ආරම්භ කිරීම, වෙළඳ ව්‍යාපාර දියුණු වීම, මංමාවත්, ප්‍රවාහන සේවා, පණිවිඩ හුවමාරු ක්‍රම හා ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත වීම නිසා පැරණු සමාජ ව්‍යුහය මුළුමනින් ම වෙනස් අතකට යොමු විය.

(වචන 115)



agaram.lk

V. සෑම කළමානාකරුවෙකුගේ ම කාර්යය වනුයේ සේවකයන්ගේ අභිප්‍රායන් සංවිධාන අරමුණු ළඟා කර ගැනීම දෙසට යොමු කර වීම යි. සාමාන්‍යයෙන් තමන්ගේ කුමන චර්යාවන් කළමනාකරුවන් විසින් අගය කරන්නේ ද යන්න සේවකයෝ නො දකිති. එසේම සේවකයන් යම් කාර්යයක නිතර වීමේ දී ඔවුන් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි බොහෝ විට කළමනාකරුවන්ට ද අවබෝධයක් නැත. සේවකයන්ගේ ඵලදායීතාවය අඩු වූ විට හෝ පැවරූ කාර්යය නියමිත ලෙස ඉටු නොකළ විට පමණක් කළමනාකරුවෝ කලබලයට පත් වෙති. මින් පෙනී යන්නේ සංවිධානයන්හී සේව්‍ය - සේවක සම්බන්ධය අතර පරස්පර විරෝධී අදහස් ඇති විය හැකි බවත්, ඒවා අවම කරගත හැකි ප්‍රධානතම පිවිසුමක් වනුයේ කළමනාකරුවන් විසින් තම සේවකයන් අභිප්‍රේරණය කළ හැක්කේ කුමන දේවල් සපුරා දීම තුළින් ද ඒවා සපුරා දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ඇති ව කටයුතු කිරීමෙන් බව පෙනී ගොස් ඇත.

(වචන 124)

(ල. 10 x 5 = 50)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk